පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය
රුහුණ විශ්වවිද්‍යාලය
ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව
පළමු සමාසික පරීක්ෂණය 2023

# MAE5101 සාර්ව ආර්ථික න්‍යාය

I-කොටසින් ප්‍රශ්න දෙකක් ද, II-කොටසින් ප්‍රශ්න දෙකක් ද බැගින් ප්‍රශ්න **හතරක් (4) ක්** තෝරාගෙන පිළිතුරු සපයන්න.

**කාලය පැය 03** **ලකුණු 60**

## I-කොටස

(1) පහත සටහනේ දැක්වෙන්නේ 2019 වර්ෂය අවසානයේ දී ශ්‍රී ලංකා ආර්ථිකයේ ජාතික නිමැවුම, පොලී අනුපාතිකය හා වෙළෙඳ ශේෂයේ ස්වරූපය යි. මෙම සටහන ඇඳීමේ දී ශ්‍රී ලංකාවේ පවතින විනිමය අනුපාත ප්‍රතිපත්තිය හා ප්‍රාග්ධන සංචලතාවයේ සවභාවය සැලකිල්ලට ගෙන ඇත.



(i) 2019 ජනාධිපතිවරණයෙන් පසුව ශ්‍රී ලංකා ආර්ථිකයේ සිදුවූ පහත දී ඇති සිද්ධීන් නිරූපණය වනසේ ඉහත IS-LM-BOP සටහනේ වක්‍ර සුදුසු පරිදි විතැන් කර නැවත අඳිමින්, පැවති සමතුලිතයේ සිට නව සමතුලිතයක් කරා ගමන් කළ ආකාරය විස්තර කරන්න.

- 2020 කොවිඩ් වසංගතය හේතුකොටගෙන පරිභෝජනය, ආයෝජනය හා අපනයන නිමැවුම් කඩා වැටුණි.
- මහ බැංකුව මගින් ට්‍රිලියන 1.5කට ආසන්න ප්‍රමාණයක මුදල් මුද්‍රණය කර රජයට ණය ලබා දුන්නේ ය.
- 2020 අග වන විට පොලී අනුපාත 10% න් පහළට අසාමාන්‍ය ලෙස පහත වැටී ආර්ථික වර්ධන වේගය සෘණ අගයකට වැටුනේ ය.
- විනිමය අනුපාතය කෘත්‍රිම ලෙස ඉහළ අගයක තබාගත් අතර රථ වාහන ඇතුළු ආනයන භාණ්ඩ විශාල ප්‍රමාණයක් සීමා කිරීම නිසා වෙළෙඳ ගිණුමේ හිඟය සුළු ප්‍රමාණයකින් අඩු විය.

(මෙම කරුණු ඔබ විසින් ප්‍රති නිර්මාණය කරන ලද රූප සටහන තුළ නිරූපණය වන ආකාරය විස්තර කර තිබිය යුතු ය.)

(ලකුණු 10)

(ii) 2021 වසරින් පසුව සිදු වූ පහත සඳහන් සිද්ධීන් නිරූපණය වන සේ ඔබ විසින් ඉහත අඳින ලද රූප සටහන සංශෝධනය කර නැවත අඳින්න.

- 2022 මාර්තු වන විට විනිමය අනුපාතය පාලනයෙන් මුදා හල අතර අපනයන ඉපයුම් යථාවත් වී වෙළෙඳ ගිණුමේ හිඟය කුඩා විය.
- මහ බැංකුව මගින් සංකෝචනාත්මක මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට තීරණය කිරීම නිසා 20% ඉක්මවා පොලී අනුපාත ඉහළ ගිය අතර ආර්ථික වෘද්ධි වේගයේ සෘණ අගය ඉහළ ගියේ ය.

(මෙම කරුණු ඔබ විසින් ප්‍රති නිර්මාණය කරන ලද රූප සටහන තුළ නිරූපණය වන ආකාරය විස්තර කර තිබිය යුතු ය.)

(ලකුණු 05)

(2) ඔබේ ගමේ කෘෂිකාර්මික, කාර්මික හා සේවා අංශවල නිෂ්පාදනයේ නියුතු පුද්ගලයින් 300ක් ජීවත් වන බවත්, ශ්‍රී ලංකාව ගම්මාන මට්ටමින් ජාතික ගිණුම් සකස් කිරීමට පියවර ගන්නා බවත් උපකල්පනය කරන්න. ඒ අනුව, ඔබේ ගම වෙනම රටක් ලෙස ද, අනෙකුත් සියලු ගම්මාන විදේශ රටවල් ලෙස ද සලකා, ඔබේ ගමට අදාලව ජාතික ගිණුම් සකස් කළ යුතුව ඇත. එකතු කළ වටිනාකම් ක්‍රමය (Value added method) මත පදනම් වූ නිෂ්පාදන ප්‍රවේශය හෝ ආදායම් ප්‍රවේශය යන දෙකෙන් එකක් පමණක් තෝරාගෙන ඔබේ ගමේ දළ දේශීය නිෂ්පාදිතය තක්සේරු කරනා ආකාරය විග්‍රහ කරන්න.

(ලකුණු 15)

03. (i) ගෙවුම් තුලන ලේඛනයක අන්තර්ගත උප ගිණුම් හඳුන්වා දී, ඒ එක් එක් උප ගිණුම තුළ අන්තර්ගත වන ගනුදෙනු සඳහා උදාහරණ දක්වන්න. (ලකුණු 04)

(ii) ගෙවුම් තුලන ලේඛනයක අන්තර්ගත ගනුදෙනුවල වටිනාකම් වෙනස් වීම පාවෙන විනිමය අනුපාතිකයක් උච්ඡාවචනය වීමට තුඩුදෙන ආකාරය විස්තර කරන්න. (ලකුණු 04)

(iii) CIF වටිනාකම ජපන් යෙන් 40,000ක් වූ ටොයෝටා මෝටර් රථයක් ඔබේ පුද්ගලික පරිහරණය සඳහා ජපානයෙන් ආනයනය කළ යුතුව ඇතැයි සිතන්න. අදාළ ලිපි ලේඛන පිළිබඳව ද සඳහන් කරමින් මෝටර් රථය හම්බන්තොට වරායෙන් නිදහස් කරගන්නා අවස්ථාව දක්වා ඔබ අනුගමනය කරන ක්‍රියා පිළිවෙල විස්තර කරන්න. (ලකුණු 07)

## II-කොටස

04. i. එයට පදනම් වන උපකල්පන සැලකිල්ලට ගනිමින් සේ ගේ වෙළෙඳපොළ නීතිය (Say's Law of Market) නිර්වචනය කරන්න.

(ලකුණු 04)

ii. සේවා නියුක්තිය සහ නිමවුම තීරණයවීම පිළිබඳ සම්භාව්‍ය න්‍යාය පැහැදිලි කොට එය ප්‍රස්තාරිකව නිරූපනය කරන්න.

(ලකුණු 08)

iii. සම්භාව්‍ය ආර්ථික න්‍යාය බිඳවැටීම පිටුපස පවතින හේතු සාරාංශගත කරන්න.

(ලකුණු 03)

05. i. කෙටිකාලීන පිලිප්ස් වක්‍රය යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? පිලිප්ස් වක්‍රයේ සෘණ බෑවුම පිටුපස පවතින හේතු කෙටියෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

ii. 1970 ගණන් වලින් පසු ගෝලීය මට්ටමින් ස්ථාවර පිලිප්ස් වක්‍රය බිඳ වැටීමට හේතු සැබෑ ලෝකයේ නිරීක්ෂණ ඇසුරින් විමර්ශනය කරන්න.

(ලකුණු 05)

iii. "දිගු කාලයේ දී උද්ධමන අනුපාතිකය සහ සේවා වියුක්ති අනුපාතිකය අතර ගැටීමක් (trade off) නොපවතී." අනුවර්තීය අපේක්ෂණ න්‍යාය (Theory of Adopting Expectations) යොදා ගනිමින් ඉහත ප්‍රකාශය පිළිබඳව ඔබගේ මතය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

06. යෝග්‍ය රූප සටහන් ඇසුරින් පහත සංකල්ප පැහැදිලි කරන්න.

i. සමපේක්ෂණ මුදල් ඉල්ලුම (Speculative Demand for Money.)

ii. ඉල්ලුමෙන් ඇදුන උද්ධමනය (Demand- Pull Inflation)

iii. අවපාතෝද්ධමනය (Stagflation)

iv. තාර්කික අපේක්ෂණ න්‍යාය (Rational Expectation Theory)

v. ද්‍රවශීලතා පාෂය යටතේ මුල්‍ය ප්‍රතිපත්තියේ සඵලතාව (Effectiveness of Monetary Policy under Liquidity Trap)

(ලකුණු 15)